# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු / සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

## ජනසන්නිවේදනය (නව/පැරණි නිර්දේශය)

## සංවර්ධනය, ජනමාධ්‍ය භාවිතය, ආයතන හා සංවිධාන MACO – E 2025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. "සංවර්ධනය යන්න ආර්ථික වර්ධනයට පමණක් සීමා නොවූවකි." නිර්වචන ඇසුරෙන් පහදන්න.

2. ජාතික සංවර්ධනයේ දී ජනමාධ්‍යයේ කාර්යභාරය පිළිබඳව විල්බර් ශ්‍රාම් පුළුල් විවරණයක් සිදු කරයි. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

3. ග්‍රාමීය සංවර්ධන අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමේ දී ප්‍රජා ගුවන්විදුලියේ කාර්යභාරය සුවිශේෂී වේ. විමසන්න.

4. සංවර්ධන ව්‍යාපෘතිය යන්න පැහැදිලි කරමින් හඳුනාගත් සංවර්ධන ගැටලුවක් විසඳීම සඳහා උචිත සංවර්ධන ව්‍යාපෘති සැලසුමක් සකස් කරන්න.

5. "ලෝක සාමය උදෙසා නිර්මාණය වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය රාජ්‍යයන්හි සංවර්ධනය වෙනුවෙන් ද පෙනී සිටී." උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

6. සංවර්ධන සන්නිවේදන පර්යේෂණයන්ගේ වැදගත්කම විවිධ පර්යේෂණ මානයන් ඔස්සේ පැහැදිලි කරන්න.

7. නව මාධ්‍ය සංවර්ධන සන්නිවේදනය සඳහා ඵලදායීව භාවිතා කළ හැකි ආකාරය නිදසුන් සහිතව විමසන්න.

8. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව සටහන් ලියන්න.
   - I. සම්ප්‍රදායික සන්නිවේදනය
   - II. රාජ්‍ය නොවන සංවිධාන
   - III. දේශීය සංවර්ධන ආයතන
   - IV. සංවර්ධන සන්නිවේදනයේ අරමුණු